# ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තියේ මෑත කාලීන ප්‍රවණතා

ඩබ්.එම්.එන්.එස්. දසනායක, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
ndasanayake7@gmail.com

ඒ.එම්.එන්. ජීවන්ති අබේකෝන් ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
nimarshani03@gmail.com

**සංක්ෂේපය**

විදේශ සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයින් විගමනය පිළිබඳ පැරණි ඉතිහාසයක් ඉදිරිපත් කළ නොහැකි ය. මෙරට ශ්‍රමිකයින් රැකියා සඳහා රටින් පිටවීමේ මුල් ම අවස්ථාවක් ලෙස වාර්තා වන්නේ 20 වන සියවසයේ මුල් භාගයේදී ය. වර්තමානයේ දී ජාතික ආදායම සඳහා දායකත්වය ලබාදෙන අංශ අතරට විදේශ රැකියා මඟින් ආදායම් ඉපයීම වැදගත් ස්ථානයක් හිමිකරගෙන තිබේ. මෙම ලිපිය මඟින් අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ මෑත කාලීන විදේශ සේවා නියුත්තිය ප්‍රවණතා හඳුනාගැනීම යි. ඒ අනුව විදේශ සේවා නියුක්තියේ ආරම්භය හා එහි ව්‍යාප්තිය, විදේශ සේවා නියුක්තියේ විවිධ පැතිකඩ පිළිබඳව මෙහි අන්තර්ගත වේ. මේ සඳහා පොත්පත්, සඟරා, අන්තර්ජාල තොරතුරු ආදිය ද්විතීයික දත්ත මූලාශ්‍ර ලෙස භාවිතාකර ඇත. වර්තමානය වන විට විදේශ සේවා නියුක්තියේ ස්ත්‍රී දායකත්වය අභිබවා පුරුෂ දායකත්වයේ වර්ධනයක් වී ඇත. පසුගිය වසර කිහිපය තුළ සියලු සාම්ප්‍රදායික විදේශ විනිමය ප්‍රභවයන් අභිබවමින් විදේශ රැකියාවල නිරත වූවන් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන විදේශ විනිමය ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය උපයන මාර්ගය බවට පත් වී ඇත.

**මුඛ්‍ය පදඃ** විදේශරැකියා, විගමනය, සේවා නියුක්තිය, ශ්‍රම සංක්‍රමණ, ශ්‍රී ලංකාව

## හැඳින්වීම

ඉදිරි වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉතා ශීඝ්‍ර වර්ධනයක් ඉලක්ක කර ඇති අතර, එවන් තිරසාර වර්ධන වේගයක් පවත්වා ගැනීම සඳහා රටෙහි සියලු ම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගත යුතු ය. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධක අතුරින් ශ්‍රමය බහුල රටවල් ශ්‍රම සූක්ෂමතාව මත පදනම්ව ආර්ථික කටයුතු සිදුකරනු ලබයි. මූලික වශයෙන් ම ලබා ගත හැකි කිසිඳු විකල්ප යෙදවුමක්ට වඩා ශ්‍රමය යෙදවුමක් ලෙස භාවිතා කිරීමෙන් වඩාත් කාර්යක්ෂම භාණ්ඩ හා සේවා නිපදවීම හා අලෙවි කිරීමට ඇති හැකියාව නිසා ශ්‍රමය ඉතාම වැදගත් යෙදවුමකි (හිඳුල්ලආරච්චි, 2009). රටක් සංවර්ධනය කිරීම සඳහා එම රටේ වෙසෙන්නන්ගේ සක්‍රීය දායකත්වය අත්‍යවශ්‍ය වේ. රටක ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය සහ ක්‍රියාශීලී නොවන ජනගහනය දෙකොටසකි (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2008). ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය ලෙස වෙන් කළ හැකි ය. ඒ අනුව විදේශ සේවා නියුක්තිය සේවා නියුක්ත ජනගහනයේ එක් අංශයකි.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය සලකාබලන විට විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් විගමනය වීමක් පිළිබඳ තොරතුරු ලැබී නැත. නමුත් ක්‍රි.ව. 1840 ට පසුකාලීනව බ්‍රිතාන්‍යයන් විසින්

ලංකාවට හඳුන්වා දුන් වතුවගාවේ ප්‍රතිඵලයක් ලෙස සංක්‍රමණිකයින් භාරගන්නා රටක් ලෙස ශ්‍රී ලංකාව ක්‍රියාකර ඇති බව පෙනේ. විදේශගත වූවන් පිළිබඳ තොරතුරු 20 වන ශතවර්ෂයේ මුල්භාගයේ සිට ම ලැබී ඇතත් විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් විගමනය වීමක් පිළිබඳ තොරතුරු ලැබී ඇත්තේ 1960 ගණන්වල සිට ය. 1960 ගණන්වල සිට විදේශ රැකියා සඳහා වෛද්‍යවරු, ගණකාධිකාරීවරු, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු යන වෘත්තිකයන් යුරෝපීය රටවලට, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, යන රටවල රැකියා සඳහා විගමනය වීමක් සිදු වී ඇති බව පෙනේ (ආරියවතී, 2003). 1972 න් පසු දශක දෙක මෙරට ශ්‍රම විගමනය පිළිබඳ පැහැදිලි සංවර්ධනයක් පෙන්නුම් කරයි. 1973 මැද භාගයේ පටන් තෙල් බැරලයක මිල ඇ.ඩො. 33 දක්වා ඉහළ නැංවීමට තෙල් අපනයන කරන රටවල් (ඔපෙක්) ගනු ලැබූ සංවර්ධන තීරණයත් සමඟ ඇති වූ මැදපෙරදිග රටවල ආර්ථික සංවර්ධනයේ දැවැන්ත බලපෑම මත විගමනික ශ්‍රමිකයන් සඳහා ද මැදපෙරදිග රටවල් විවෘත වෙළෙඳපොලක් විය. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ විදේශ ගමන් සඳහා නිදහස ලබාදීමෙන් රැකියා සඳහා විදේශ රටවල් කරා ඇදීයාමේ දොරටු විවෘත කිරීමෙන් ශ්‍රී ලාංකිකයින් විශාල සංඛ්‍යාවක් ගෘහසේවක/සේවිකා, රියදුරු, ඇඟලුම් කර්මාන්ත, කෝකිවරු වැනි රැකියා සඳහා යොමුවිය (මහජන බැංකුව, 1996). ශ්‍රී ලංකාව සංවර්ධනය කරා යන ගමනේ දී ආයෝජන සම්පත් වර්ධනය කර ගැනීම සඳහා විදේශ විනිමය ඉපයුම් වැදගත් කාර්යයක් ඉටුකරයි. 1985 පමණවන තෙක් ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය ඉපයීමේ මාර්ගය තේ නිර්යාත වුව ත් 1977 න් පසු මෙම තත්ත්වය විදේශ පෞද්ගලික සංක්‍රාම හිමිකරගෙන ඇත. එමනිසා ශ්‍රී ලංකා රජය ද විදේශ පෞද්ගලික සංක්‍රාම කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇත. 1979 දී විදේශ රැකියා සඳහා විගමනය වූ මුළු පිරිස 25875 ක් බව ගුවන් තොටුපල සමීක්ෂණවලින් වාර්තා වී ඇත. 2013 දී 293218 ක් ද විදේශ රැකියා සඳහා විගමනය වූ බව වාර්තා වී ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014). ශ්‍රී ලංකාවේ ශ්‍රමික සංක්‍රමණයේ සුවිශේෂ ලක්ෂණයක් වූයේ පිරිමින්ට සාපේක්ෂව ඉතා ඉහළ ප්‍රතිශතයක් කාන්තාවන්ට හිමිව තිබීම යි. එයට හේතුව ලෙස සලකා බලන්නේ විදේශවල ගෘහසේවයේ යෙදීම පිණිස ශ්‍රී ලාංකික කාන්තාවන්ට තිබූ ඉල්ලුම හා එයට සරිලන අයුරින් ද සැපයීමට ද හැකිවීම යි. ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා යොමු වීම කෙරෙහි නොයෙකුත් හේතු බලපා ඇත. ඒ අතර සේවා වියුක්ති තත්ත්වයන්, ආර්ථික ප්‍රශ්න, සිත් ඇඳගන්නා සුළු වැටුප් ලැබීම ආදිය විශේෂ හේතු ලෙස දැක්විය හැකි ය.


### ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිය

හැත්තෑව දශකයේ වෙනත් දකුණු ආසියානු රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද අත්විඳි වැදගත් කරුණක් වූයේ ශ්‍රමික සංක්‍රමණය ආරම්භවීම යි. ඉහළ ගිය තෙල් ආදායමත් සමඟ මැද පෙරදිග රටවල ක්‍රියාත්මක වූ විවිධ මාදිලියේ සංවර්ධන ව්‍යාපෘති නිසාවෙන් එහි ශ්‍රමික වෙළෙඳපොළ විදේශිකයින් සඳහා පුළුල් ලෙස විවෘත විය (මහජන බැංකුව, 2007). මැද පෙරදිග රටවල් විසින් ආරම්භ කරන ලද ශීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියේ දී ඔවුන් මුහුණ පෑ ප්‍රධාන ගැටළුව වූයේ සියලු ම මට්ටමේ මිනිස්බල හිඟය යි. මේ නිසා ඔවුන් තම රටවල සංවර්ධන ව්‍යාපෘතීන්ට අවශ්‍ය මිනිස්බලය සපුරා ගැනීම සඳහා සංක්‍රමණික ශ්‍රමිකයින් කෙරෙහි යොමුවිය. විශේෂයෙන් ම මෙම රටවල පවතින සංස්කෘතික ලක්ෂණවලට අනුව ස්ත්‍රීන් රැකියාවල අනුයුක්ත නොවීම නිසා ශ්‍රම හිඟයට පිළියම් ලෙස සංක්‍රමණික ශ්‍රමිකයින් ලබාගැනීමට සිදුවිය. එමෙන් ම මැද පෙරදිග ජනතාව කය වෙහෙසන

රැකියාවල නිරත වීම අවමානයක් ලෙස සැලකීමත්, එමගින් ලැබෙන වැටුප් හා වේතනවලට වඩා වැඩි ධනස්කන්දයක් සොයාගැනීමට මාර්ගයන් මැද පෙරදිග රටවල පවතින නිසාත් පුරුෂ පක්ෂය ද ශ්‍රම සැපයීමෙන් නිෂ්පාදනයට දායකවීම අඩු ය. මෙවැනි හේතු පදනම් කරගෙන මෙම රටවල සංවර්ධන ක්‍රියාවලියේ මුල් අදියරවල දී යේමනය, සුඩානය, ඊජිප්තුව, වැනි අසල්වාසී අරාබි රටවලින් ශ්‍රමය සපයාගන්නා ලදී (ආරියවතී, 2003). එමෙන් ම පිලිපීනය, කොරියාව, ඉන්දියාව, පකිස්ථානය, තායිලන්තය, බංග්ලාදේශය, ශ්‍රී ලංකාව ද මෙම කලාපයේ රැකියා සඳහා ශ්‍රමය සැපයීමේ කර්තව්‍යයට අවතීර්ණ විය (මහජන බැංකුව, 1996).

1970 න් පසු ලංකාවට හඳුන්වාදුන් නිදහසේ ගලායන සංක්‍රමණ ප්‍රතිපත්තියත්, 1973 අංක 32 දරණ විදේශ රැකියා නියුක්ති පනත සම්මත කරගැනීමත් සමඟ විදේශ රැකියා සඳහා යොමුවන ජන සංඛ්‍යාව වැඩිවිය. විදේශ රැකියා සඳහා යොමුවන පිරිස වැඩිවෙත් ම ඒ සඳහා ක්‍රමවත්ව ශ්‍රමිකයින් යොමුකිරීමේ අරමුණින් 1985 දී විදේශ රැකියා නියුක්ති පනත සම්මත කරන ලදී. මෙම පනත යටතේ විදේශ සේවා නියුක්ති කාර්යංශය පිහිටුවීමත් සමඟ ව්‍යවස්ථානුකූලව විදේශ සේවා නියුක්ති කටයුතු කරගෙන යාමට හැකිවිය (ආරියවතී, 2003). විදේශ රැකියා සෙවීමේ ප්‍රවනතාව කැපීපෙනෙන කරුණකි. ශ්‍රී ලංකාවේ 2013 වර්ෂයේ මිලියන 20.48 ක මුළු ජනගහනයෙන් ශ්‍රම බලකායට අයත්වන ප්‍රමාණය මිලියන 8.8 කි. ඉන් සේවා වියුක්ති ප්‍රමාණය 384000 ක් වන අතර, සේවා වියුක්ති අනුපාතය 4.4% කි. මෙහි කාන්තා සේවා වියුක්ති අනුපාතිකය ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස 6.6% ක් වන අතර, පිරිමි සේවා වියුක්ති අනුපාතිකය 3.2% ක් වේ. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව 2013 වසරේ දී අවුරුදු 15-19 කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය 18.7% ක් වූ අතර, අවුරුදු 20-24 කාණ්ඩයේ 19.2% ක සේවා වියුක්ති අනුපාතයක් පවතී (මහ බැංකු වාර්ෂික වාර්තාව, 2014).

ප්‍රස්ථාර සටහන 1 **:** ශ්‍රී ලාංකික ශ්‍රම විගමන දත්ත 1986-2013




මූලාශ්‍රය: විදේශ සේවා නියුක්ති කාර්යාංශය, 2013

1986 සිට 1994 දක්වා කාලය සලකා බලනවිට තරමක විචලනයක් සහිතව ශ්‍රම විගමනයේ ඉහළ යාමක් පෙන්නුම් කරයි. පසුගිය කාල සීමාව සලකාබලන විට ඉහළ ම

අගයක් වාර්තා වී ඇත්තේ 2013 වර්ෂයේ ය. එහි අගය 293218 ක් වේ. අඩු ම අගයක් වාර්තා වී ඇත්තේ 1986 වර්ෂයේ 14456 ක් ලෙසිනි. 1995 වර්ෂයේ දී විදේශ රැකියා සඳහා පිටත්ව යාමේ වර්ධනයක් පෙන්නුම් කරයි. ඊට හේතුව ලෙස එම වර්ෂයේ දී නුපුහුණු සේවකයින් සඳහා වැඩි ඉල්ලුමක් පැවතීමත්, ඉන් වැඩි කොටසක් එනම් 66% ක් පමණ සේවිකාවන් සඳහා විය. වේගවත් ආර්ථික සංවර්ධනයක් පෙන්නුම් කරන දකුණු ආසියාතික හා ආසියාතික රටවලින් නව රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් බිහිවීම 1995 වර්ෂයේ විදේශ සේවා වියුක්තිය ඉහළ යාමට දායක විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 1995).

2006 වසරේ සිදු වූ ශ්‍රම විගමනයේ තාවකාලික පසු බැසීම ප්‍රකෘති තත්ත්වයට පත් කරමින් 2007 වර්ෂය වනවිට 218459 දක්වා 8.2% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2008 වර්ෂයේ විදේශ රැකියා සඳහා පිටත්ව යාම 250499 ක් වූ අතර, එය 2007 වර්ෂයට වඩා 14.7% ක වර්ධනයකි. ගෝලීය ආර්ථික අවපාතයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රමිකයින් සඳහා විදේශවලින් ලැබුණු ඉල්ලුම අඩුවීම නිසා 2009 වර්ෂයේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පිරිසේ අඩුවීමක් පෙන්නුම් කෙරුණි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2009). සියලු ම මිනිස්බල කාණ්ඩයන්හි වර්ධනයක් 2008 වර්ෂයේ දී වාර්තා වේ. 2004 වර්ෂයේ සිට 2013 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ විදේශසේවා සඳහා පිටත්ව යාම 37.4% ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෑත වර්ෂ පිළිබඳ සලකාබලන විට 2012 වසරේ දී වාර්තා වූ 282447 ට සාපේක්ෂව 2013 වසරේ දී 293105 දක්වා 3.8% කින් වැඩි විය. වෘත්තිකයන්, මධ්‍යම මට්ටමේ සේවකයන්, ලිපිකරු, පුහුණු ශ්‍රමික හා නුපුහුණු ශ්‍රමික යන කාණ්ඩ යටතේ පිටත්ව ගිය ප්‍රමාණයේ වර්ධනය මුළු විගමනයේ ඉහළයාමට හේතු වී ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 2013).

වගු අංක **1 :** ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනය විස්තරාත්මක සංඛ්‍යානය ඇසුරින්

| | N | Range | Min | Max | Mean | Median | Std. Deviation | Skewness |
|---|---|---|---|---|---|---|---|---|
| | Statistic | Statistic | Statistic | Statistic | Statistic | Statistic | Statistic | Statistic |
| Number of Foreign Employment | 28 | 278978 | 14127 | 293105 | 165632.29 | 180961.5 | 85169.70 | -.544 |


මූලාශ්‍රඃ විදේශ සේවා නියුක්ති කාර්යංශය, 2013.

ඉහත වගුවේ සඳහන් පරිදි 1986 සිට 2013 දක්වා වර්ෂ 28 ක දත්තවලට අනුව විදේශ සේවා නියුක්තියේ මධ්‍යයන අගය 165632.29 කි. ඉන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාව තුළ සාමාන්‍යයෙන් වාර්ෂිකව විදේශ සේවා නියුක්ත වන්නන්ගේ ප්‍රමාණය යි. විදේශ සේවා නියුක්තියේ උපරිම අගය 293105 ක් වන අතර, එය 2013 වර්ෂයේ දී වාර්තා වේ. අවම අගය 14127 ක් ලෙස 1987 දී වාර්තා වී ඇත. මේ අනුව 1987 සහ 2013 වර්ෂවලට අදාළව විදේශ සේවා නියුක්තියේ 278978 ක වෙනසක් පවතී. මෙහි සම්මත අපගමනය 85169.700 ක් වන අතර, ඉන් අදහස් වන්නේ විදේශ සේවා නියුක්තියේ සාමාන්‍ය අගයේ සිට 85169.700 කින් අපගමනය වී ඇති බවයි. කුටිකතාවය මගින් දත්ත ව්‍යාප්තියක සමමිතික බව නිරූපණය වන අතර, මෙම දත්ත ව්‍යාප්තියෙහි විදේශ සේවා නියුක්තියේ

කුටිකතා අගය සෘණ 0.544 ක් වේ. එනම් මෙහි දත්ත සෘණ කුටිකව ව්‍යාප්ත වී ඇත. ඉන් පැහැදිලි වන්නේ මධ්‍යන්‍ය අගය ඉක්මවා මධ්‍යස්ථ අගය පිහිටන බවයි.

මුල් කාලවල දී විදේශ රැකියා සඳහා විගමනය වූවන් පිළිබඳව නාගරික ප්‍රදේශවලින් වාර්තා වුව ද වර්තමානය වනවිට ලංකාවේ සියලු පලාත්වලින් විදේශ රැකියා සඳහා විගමනය වූවන් පිළිබඳ තොරතුරු වාර්තා වේ. ශ්‍රී ලංකාවේ පවතින සැලකිය යුතු ආර්ථික ප්‍රශ්න දෙකක් වන විදේශ විනිමය හිඟයට හා රැකියා වියුක්තියට පිළියමක් ලෙස විදේශ සේවා නියුක්තිය පෙන්වා දිය හැකි ය. ලංකාවට විදේශ විනිමය උපයා දෙන මාර්ගයක් ලෙස විදේශ රැකියා මුල්තැන ගෙන ඇති නිසා රටට අවශ්‍ය විනිමය ලබාගැනීම සඳහා රජය මෙම විදේශ රැකියා කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

ප්‍රස්ථාර සටහන 2 : විගමන ශ්‍රමිකයන්ගේ දිස්ත්‍රික් විසුරුම 2008-2013





මූලාශ්‍රඃ විදේශ සේවා නියුක්ති කාර්යංශය, 2013

මැද පෙරදිග රැකියා අවස්ථා සඳහා ශ්‍රී ලාංකිකයින්ට දොරටු විවෘත වීමෙන් පසුව මේ පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු ගුවන් තොටුපල සමීක්ෂණ, විදේශ සේවා නියුක්ති කාර්යංශය මගින් කරනු ලැබූ අධ්‍යයනයන්ගෙන් අනාවරණය විය. විදේශගත වූවන් පිළිබඳ ඉහත ප්‍රස්ථාර 1 සහ 2 සටහන් මගින් පැහැදිලි වේ. ඉහත ප්‍රස්ථාර 2 මගින් දක්වා ඇත්තේ 2008 සිට 2013 දක්වා මුළු විදේශගත වූවන්ගේ ප්‍රමාණයෙන් දිස්ත්‍රික් මට්ටමින් විදේශ රැකියා සඳහා විගමනය වූ පුද්ගල සංඛ්‍යාවේ ප්‍රතිශතය වේ. මෙම වසර හය තුළ ඉහළ ම ශ්‍රම විගමනයක් වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එමෙන් ම මෙම කාලය තුළ ඉහළ ශ්‍රම විගමනයක් බස්නාහිර පළාත මගින් අනාවරණය වේ. අඩු ම ශ්‍රම විගමනයක් කිලිනොච්චිය, මන්නාරම යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත. මඩකලපුව දිස්ත්‍රික්කයෙන් 2008 වසරේ විදේශගත වූ 11021 ක් වූ පුද්ගලයින් සංඛ්‍යාව 2013 වසරේ දී 20411 දක්වා විශාල වර්ධනයක් පෙන්නුම් කරයි. එය වසරින් වසර ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. 2008 වසරට සාපේක්ෂව 2013 වසරේ අම්පාර හා පුත්තලම දිස්ත්‍රික්කවලින් විදේශගත වූ සංඛ්‍යාවේ ද ශීඝ්‍ර වර්ධනයක් දැකිය හැකි ය. අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් විදේශගත වීම් සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි.

**රටවල් අනුව ශ්‍රී ලාංකිකයින්ගේ විදේශගතවීම්**

1970 දශකයට පෙර විදේශ රැකියා සඳහා යොමු වී සිටි පිරිස බොහෝ දුරට උතුරු ඇමරිකාව, ඕස්ට්‍රේලියාව, යුරෝපීය රටවල්වලට විගමනය වී ඇත (ආරියවතී, 2013). එහෙත් 1970 දශකයෙන් පසු මැදපෙරදිග රටවල ඇති වූ විශාල ශ්‍රම ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලාංකිකයින් විශාල පිරිසක් මැද පෙරදිග හා ඊට ආසන්න කලාපවලට සේවා නියුක්ත වී ඇත. 2000 දශකයේ මුල සිට ම සෞදි අරාබිය, කටාර්, කුවේට්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවල ගෘහ සේවිකා හා නුපුහුණු ශ්‍රමික ඉල්ලුම හේතුවෙන් එම රටවලට ශ්‍රමික ශ්‍රී ලාංකික පිරිස් රැකියාවන් සඳහා යොමු වී ඇති බව සංඛ්‍යා සටහන් මඟින් පැහැදිලි වේ.


ප්‍රස්ථාර සටහන 3 : රටවල් අනුව ශ්‍රී ලාංකිකයින් විදේශරැකියා සඳහා පිටත්වීම්




මූලාශ්‍ර: විදේශ සේවා නියුක්ති කාර්යංශය,2013

මෙම ප්‍රස්ථාර සටහන් මඟින් පෙනීයන්නේ සෞදි අරාබිය සඳහා විශාල පිරිසක් රැකියා සඳහා විගමනය වී ඇති බවයි. නමුත් 2013 වර්ෂයේ දී සෞදි අරාබිය සඳහා පිටත්වන විදේශ සේවා නියුක්තිකයන්ගේ අඩු වීමත්, කටාර් රාජ්‍ය සඳහා පිටත්වන විදේශ සේවා නියුක්තිනයන් වැඩි වීමත් පෙන්නුම් කරයි. මව්වරුන් විදේශ රැකියා සඳහා පිටත් වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සමාජීය පිරිවැය අවම කිරීමේ අරමුණින් හඳුන්වා දෙන ලද විවිධ ක්‍රියාමාර්ග හේතුවෙන් ගෘහ සේවිකා කාණ්ඩය යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යාම්වල අඩු වීම 2013 වර්ෂයේ දී සෞදි අරාබිය වෙත රැකියා සඳහා පිටත්ව යාම් අඩු වීමට හේතුව යි. එසේම පුහුණු හා නුපුහුණු රැකියා සඳහා පුරුෂයින්හට කටාර් රාජ්‍යයෙන් ලැබුණු ඉල්ලුම ඉහළ යාම 2013 වර්ෂයේ දී කටාර් වෙත රැකියා සඳහා පිටත්ව යාම් වැඩි වීමට හේතුව යි. කුවේටය සඳහා විගමනය වන ශ්‍රම පිරිසේ සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරයි. බහුතරය ගෘහ සේවිකාවන්ගෙන් සමන්විත වූ සංක්‍රමණික ශ්‍රම බලකායේ විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්වයාම් වලින් 80% ක් පමණ නියෝජනය කරන මැද පෙරදිග කලාපය විදේශ රැකියා වෙළෙඳපොලෙහි අඛණ්ඩ ප්‍රමුඛත්වයක් දරනු ලැබීය.

ප්‍රස්ථාර සටහන 4 : ස්ත්‍රී/පුරුෂ භාවය අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යාම




මූලාශ්‍රයː විදේශ සේවා නියුක්ති කාර්යංශය, 2013

විදේශ රටවල ගෘහසේවයේ යෙදීම පිණිස ශ්‍රී ලාංකික කාන්තාවන්ට තිබූ ඉල්ලුම හා එයට සරිලන අයුරින් සැපයුමක් ද පැවතීම නිසා ශ්‍රී ලංකාවේ ශ්‍රමික සංක්‍රමණයේ සුවිශේෂ ලක්ෂණයක් වූයේ පිරිමින්ට සාපේක්ෂව ඉතා ඉහළ ප්‍රතිශතයක් කාන්තාවන්ට හිමිව තිබීමයි. නමුත් වර්තමානය වනවිට රැකියා සඳහා විදේශගතවන පිරිමින්ගේ ප්‍රතිශතය කාන්තාවන්ගේ ප්‍රතිශතයට වඩා ඉහළ අගයක් ගන්නා බව ඉහත සංඛ්‍යා දත්තවලට අනුව පැහැදිලි වේ. විදේශ සේවා නියුක්තියෙහි පුරුෂ පක්ෂයේ දායකත්වය වර්ෂ කිහිපයක සිට ම නොකඩවා වර්ධනය වන තත්ත්වයක් පැවතුණි. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන් කටාර්, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ජෝර්දානයෙහි විශේෂයෙන් ම ගොඩනැගිලි ඉදිකිරීම් සහ නිෂ්පාදන අංශයන්හි පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් සඳහා පැවතුණු ඉහළ ඉල්ලුම හේතුවෙන් සිදුවී ඇත. (ශ්‍රී ලංකා මහ බැංකුව, 2013). 2013 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුරුෂයන්ගේ සංඛ්‍යාව 21.4% කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ස්ත්‍රී පිටත්ව යාම 14.6% ක අඩු වීමක් වාර්තා කළේ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රී හා පුරුෂ පිටත්ව යාම්වල අනුපාතය 2012 වසරේ දී 49:51 කට සාපේක්ෂව 2013 වසරේ දී 40:60 ක් විය.

විදේශ සේවා නියුක්තිය හේතු කොටගෙන ශ්‍රී ලංකාවට විදේශ විනිමය සපයාදීමට දායක වුව ද සමාජයට ඇතිවන බලපෑම් ද සුළුපටු නොවේ. විශේෂයෙන් ම කාන්තාවන්ගේ විදේශ සේවා නියුක්තිය දිගුකාලයක් තිස්සේ සමාජීය බලපෑම් ඇතිකර තිබේ. මව විදේශගත වීමෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, දරුවන් නොමඟයැම්, සැමියාගේ අනියම් සම්බන්ධතා, බීමත්කම ආදී සමාජ ජීවිත ගැටළු පුවත්පත් මඟින් නිරන්තරයෙන් අසන්නට ලැබේ. අනෙක් අතට විදේශ ශ්‍රමිකයන්ගෙන් තවත් පිරිසකට රැකියා ස්ථානයේ දී ඇතිවන තාඩන පීඩනයන්ට මුහුණ දීමත් ඒ නිසා දිගු කාලයක් තිස්සේ ආබාධිත තත්ත්වයේ පසුවීමත් අසන්නට ලැබේ (අබේසිංහ, 1996).

වගු අංක 2 : මිනිස් බල පදනම මත ශ්‍රම විගමනය

| ශ්‍රම කාණ්ඩය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|
| වෘත්තීය | 1653 | 2835 | 2832 | 3057 | 3848 | 4448 | 5151 |
| මධ්‍යම | 3962 | 8727 | 6388 | 6884 | 6136 | 9280 | 16510 |
| ලිපිකරු | 4551 | 6791 | 6719 | 7923 | 9907 | 16184 | 26561 |
| පුහුණු ශ්‍රමික | 50263 | 59718 | 61321 | 71537 | 67746 | 67150 | 73707 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 3499 | 5326 | 6015 | 4932 | 4182 | 3467 | 3412 |
| නුපුහුණු ශ්‍රමික | 52176 | 59239 | 50173 | 60422 | 63642 | 62907 | 70977 |
| ගෘහ සේවිකා | 102355 | 107923 | 113678 | 112752 | 107500 | 119011 | 96900 |

මූලාශ්‍රයඃ විදේශ සේවා නියුක්ති කාර්යංශය, 2013


ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳපොළේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි පුහුණුව නොමැතිවීම හේතුවෙන් ගෘහ සේවිකාවන් සඳහා විදේශගතවීම් 2007 පැවති 46.9% සිට 2008 වසරේ දී 43.1% දක්වා පහත වැටුණි. විදේශගතවන අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් හා මැද පෙරදිග රටවල විශේෂයෙන් ඉදිකිරීම් හා නිෂ්පාදන අංශය සඳහා පුහුණු හා නුපුහුණු පිරිමි ශ්‍රමිකයින් සඳහා ඇති ඉහළ ඉල්ලුම මෙහි ප්‍රතිඵලයන් වේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 2008). සම්ප්‍රදායික වෙළෙඳපොළවලින් පරිබාහිර රටවල වැඩි සේවානියුක්ති අවස්ථාවන් ලබාගැනීම සඳහා සහ තාක්‍ෂණික කුසලතා සහිත රැකියාවන් සඳහා ශ්‍රී ලාංකිකයින් දිරිමත් කිරීම වෙනුවෙන් අදාළ අධිකාරීන් විසින් දරණ ලද සාමූහික ප්‍රයත්නයෙහි ප්‍රතිඵලයක් ලෙස 2010 වසරේ මිනිස්බල කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාවෙහි වෙනසක් සිදුවිය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2010). පිටත්වයාම් සංඛ්‍යාවේ සාපේක්‍ෂ වැදගත්කම අනුව තෙවන ස්ථානය හිමිකර ගන්නා නුපුහුණු සංක්‍රමණික ශ්‍රමිකයන් අධෛර්යමත් කිරීම සඳහා රජය මඟින් පියවර ගනු ලැබුව ද මෙම ශ්‍රමිකයන් මුළු පිටත්වයාම්වල ප්‍රතිශතයක් ලෙස 2010 වසරේ දී 22.6% සිට 2011 වසරේ දී 24.1% දක්වා ඉහළ යමින් එම කාණ්ඩයේ විදේශ රැකියා සඳහා පිටත්වයාම්වල විශාල වර්ධනයක් වාර්තා විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2011). මෑතකාලීන වර්ෂවලට අදාළ මිනිස්බල පදනම මත ශ්‍රමබලකාය සලකා බැලීමේ දී 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය වනවිට අර්ධ පුහුණු ශ්‍රමික හා ගෘහසේවිකාවන් හැර අනෙකුත් සියලු ශ්‍රම කාණ්ඩවල විගමනය වීමේ වර්ධනයක් පෙන්නුම් කරයි.

**ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**

පසුගිය කාලය තුළ දී සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල විදේශ විනිමය ගලා ඒම්වල ප්‍රධාන ප්‍රවාහයන් වූයේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ය. දස ලක්‍ෂයකට වැඩි ශ්‍රී ලාංකිකයින් පිරිසක් රැකියා සඳහා විදේශගතව ඇති අතර, මින් වැඩි ම පිරිසක් මැද පෙරදිග රටවලට සංක්‍රමණය වූවෝ වෙති. රජයට ලැබෙන විදේශ මූල්‍ය ලැබීම්වලට වඩා විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ඉහළ වන අතර,

පුළුල් වෙමින් පවතින වෙළෙඳ පරතරය මූල්‍යනය කිරීමේ ප්‍රධාන මූලාශ්‍රයක් බවට පත් වී ඇත. කෙසේ වෙතත් විදේශ ලැබීම්වල දී අපනයන ඉපයුම් විශේෂයෙන් රෙදිපිළි හා නිමි ඇඳුම් ප්‍රමුඛ මූලාශ්‍ර බවට පත් වී ඇතත් ඉන්පසු වැදගත් අංශයන් වී ඇත්තේ මෙම ප්‍රේෂණ හා සේවා අපනයනයන්ගෙන් ලැබුණු ඉපයුම් වේ.

ප්‍රස්ථාර සටහන 5 : ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයන්ගේ වාර්ෂික සමස්ත ප්‍රේෂණ
මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, 2007-2013




මෙම ප්‍රස්තාර සටහනින් දක්වෙන්නේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, මුළු විදේශ ප්‍රේෂණවල ප්‍රතිශතයක් ලෙස ය. මෙම වසර අට තුළ විදේශ ප්‍රේෂණයන්ගේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරයි. මේ අතරින් ඉහළ ම ප්‍රේෂණ වාර්තා වන්නේ මැද පෙරදිග රටවල්වලින් වීමත්, එහි දායකත්වය 55% ක් ඉක්මවා තිබීම ත් විශේෂත්වයකි. විදේශ සේවා නියුක්තිය රටෙහි ප්‍රධාන විදේශ විනිමය ඉපයීම් මාර්ගයක් වෙමින් 2008 වර්ෂය තුළ දී රු.මිලියන 316118 එනම් එ.ජ.ඩොලර් මිලියන 2918 ක් විදේශ සංක්‍රාම වශයෙන් ලද අතර, එය 2007 වසර තුළ දී ලැබුණු රු.මිලියන 276728 එනම්, එ.ජ.ඩොලර් මිලියන 2502 සමග සසඳන විට 16.6 ක වර්ධනයකි. සංක්‍රමණික ශ්‍රමිකයින් විසින් එවනු ලබන විදේශ ප්‍රෙෂණයන් වැඩිකර ගැනීමේ අරමුණින් බැංකු ලියාපදිංචි රැකියා නියෝජිත ආයතන සහ මාධ්‍ය යන අංශයන්ගේ සහයෝගය ඇතිව විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් දියත් කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රධාන වශයෙන් ම මෙම වැඩිවීමට හේතු වූ බව සඳහන් කළ හැකි ය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2008).

**සමාලෝචනය**

විදේශ සේවා නියුක්තියේ ආරම්භය වූ 1960 ගණන් සමග සසඳන විට වර්තමානය වනවිට විශාල ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් පිරිසක් විදේශ සේවාවල නියුක්ත වී ඇත. මුල් කාලවල දී විදේශ රැකියා සඳහා විගමනය වූවන් පිළිබඳව නාගරික ප්‍රදේශවලින් වාර්තා වුව ද වර්තමානය වනවිට ලංකාවේ සියලු පලාත්වලින් විදේශ රැකියා සඳහා විගමනය වූවන් පිළිබඳ තොරතුරු වාර්තා වේ. වර්තමානය වනවිට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් නිසා අර්ධ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් ඉක්මවා පුහුණු ශ්‍රමිකයින්ගේ වර්ධනයක් පෙන්නුම් කරයි. නමුත් තවමත් ශ්‍රී

ලංකාවේ වැඩිපුර ම විදේශ සේවා නියුක්ත වී ඇත්තේ ගෘහස්ථ රැකියා සඳහා විදේශගත වූ කාන්තාවන් ය. එමෙන් ම විදේශ සේවා නියුක්තියේ ස්ත්‍රී දායකත්වය අභිබවා පුරුෂ දායකත්වයේ වර්ධනයක් 2008 වසරේ දී පෙන්නුම් කළ ද, එහි අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරනුයේ 2010 වර්ෂයේ සිට ය. මෙය වර්තමානයේ ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තියේ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අබේසිංහ, පී., (1996 මැයි 30), ''*ජීවිතයක මැදපෙරදිග*'', දෙසතිය, වෙළුම 19, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 03.

ආරියවතී, පී.කේ (2003), ''*රැකියා සඳහා දෙමව්පියන් විදේශගතවීම දරුවන්ගේ අධ්‍යාපන මට්ටම කෙරෙහිවන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්*'', කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

රුහුණගේ, එල්. කේ., (2007) ජූලි-දෙසැම්බර්, ''*ශ්‍රමික සංක්‍රමණයඃ ශ්‍රී ලංකාවේ වර්තමාන අත්දැකීම්*'', ආර්ථික විමසුම, වෙළුම 33, පර්යේෂණ දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

රුහුණගේ, එල්. කේ., (1996), ''*ශ්‍රී ලංකා ශ්‍රම විගමනයේ ප්‍රවණතා*'', ආර්ථික විමසුම ජනවාරි, වෙළුම 21, පර්යේෂණ දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

විදේශ සේවා නියුක්තියේ වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව (2013), ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.

ශ්‍රී ලංකා මහ බැංකුව (1995-2014), ''*වාර්ෂික වර්තාව*'' ශ්‍රී ලංකා මහ බැංකුව, ඇම්. ඩී. ගුණසේන මුද්‍රණකරුවෝ, කොළඹ 01.

හිඳැල්ලආරච්චි.සී.සී, (2009), ''*සූක්ෂම ආර්ථික විද්‍යාව*'', දයාවංශ ජයකොඩි සහ සමාගම.